රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 422

මගේ අංකය:- පීඑෆ්/වත්කම්/2006 /01
රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2006.07.31

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## 2006.06.30 දිනට රජය සතු වත්කම් පිළිබඳ තොරතුරු.

2006 ජූලි 17 වන දින මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය සම්බන්ධයෙන් පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමේදී රජය සතු දේපල පිළිබඳ නිවැරදි හා සවිස්තරාත්මක තොරතුරු පවත්වා ගැනීමේ වැදගත්කම අතිගරු ජනාධිපතිතුමා විසින් අවධාරණය කරන ලදි.

02. ඒ අනුව රාජ්‍ය ආයතන සතු වත්කම් පිළිබඳ තොරතුරු ඇතුළත් පරිගණක දත්ත ලේඛනයක් පවත්වාගෙන යාමට රාජ්‍ය මුදල් දෙපර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. රාජ්‍ය වත්කම් නියි පරිදි කළමනාකරණය කර ඉන් උපරිම ප්‍රතිලාභ අත්කර ගැනීමටත්, රජයට ලැබිය යුතු බදු නොවන ආදායම් ඉහළ නැංවීම සඳහා මෙන්ම ඒකාබද්ධ අරමුදලට වැය බරක් නොවී විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ විකල්ප උපාය මාර්ගයක් සකස් කිරීමටත් මෙම තොරතුරු අවශ්‍ය වේ.

03. අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු (අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු වල පවත්වාගෙන යනු ලබන අරමුදල්/භාරයන් ද ඇතුළත් වන පරිදි ) පහත සඳහන් පරිදි රජයේ වත්කම් පිළිබඳ 2006.06.30 දිනට පැවැති තොරතුරු මේ සමඟ ඇති ආකෘතිපත් අනුව ( "ඒ" සිට "උ" දක්වා) 2006.09.01 වන දින හෝ එදිනට පෙර ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

අ. ඉඩම්

ආ. ගොඩනැගිලි

ඇ. සවිකිරීම්

ඈ. යන්ත්‍ර සූත්‍ර සහ පිරියත

ඉ. උපකරණ

ඊ. වාහන

උ. දෙපාර්තමේන්තු අරමුදල්/භාරයන් විසින් කර ඇති ආයෝජන

ඉහත තොරතුරු ඉදිරිපත් කිරීමේ දී ඒවායේ නිවැරදිතාවය සහ විශ්වාසනීයත්වය ඔබ විසින් තහවුරු කළ යුතු අතර, දෙපාර්තමේන්තු විසින් පවත්වාගෙන යනු ලබන එක් එක් අරමුදල්/භාරයන් සඳහා වෙන් වෙන්ව ආකෘතිපත් මගින් තොරතුරු ඉදිරිපත් කරනු මැනවි. එමෙන්ම මෙම තොරතුරු සෑම වසරකම දෙසැම්බර් 31 වන දිනට යාවත්කාලීන කොට එම තොරතුරුද රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලෙස දන්වමි.

04. මෙම කාර්යයෙහි වැදගත්කම හා හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින් ඔබ විසින් මෙම කාර්යය සම්බන්ධීකරණය කිරීම සඳහා වගකිව යුතු ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු නම් කර ඔහුගේ/ඇයගේ නම, තනතුර සහ දුරකතන අංකය රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් පී.ඒ.අබේසේකර මහතා (දුරකතන අංක 011-2484614) වෙත දන්වන මෙන් යෝජනා කරමි. තවද , මේ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබාගැනීම සඳහා පහත සඳහන් නිලධාරීන් ඇමතීම මැනවි.

1. එන්.එම්.ඩී. නවරත්න මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව (දුරකතන අංක 011-2484632)
2. ඒ.කේ.පී. පීරිස් මහතා. නියෝජ්‍ය අධ්‍යක්ෂ, රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ( දුරකතන අංක 011-2484618, ෆැක්ස්. 011-2431458) .

මේ සම්බන්ධයෙන් ඔබෙන් ලැබෙන සහාය අතිශයින් අගය කරමි.



පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

පිටපත් :-

| | | | |
|---|---|---|---|
| 1. | ජනාධිපති ලේකම් | - | දැනගැනීම සඳහා. |
| 2. | පළාත් සභා ප්‍රධාන ලේකම්වරු | - | දැනගැනීම සඳහා සහ පළාත් සභා වත්කම් කළමනාකරණය ,පිළිබඳව සුදුසු වැඩ පිළිවෙලක් සැකසීමට. |
| 3. | විගණකාධිපති | - | දැනගැනීම සඳහා. |

"ද" ආකෘතිය

# 2006.06.30 දිනට රජයේ වත්කම් පිළිබඳ වාර්තාව

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :-

වර්ගය - ඉඩම්

| අනු අංකය | ඉඩමේ නම පිඹුරු අංකය | මිනුම් ඒකකය හා භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)(අක්කර/රූඩ්/පර්චස්) | ඉඩම් පිළිබඳ විස්තර (සාමාන්‍ය/වාණිජ/අනෙකුත්) | පිහිටීම | | භාවිතයට | භාවිතයට නොගන්නා |
|---|---|---|---|---|---|---|---|
| | | | | දිස්ත්‍රික්කය/ප්‍රා.ලේ කොට්ඨාශය. | ග්‍රාම නි. කොට්ඨාශය | ගනී/ නොගනී | භූමි ප්‍රමාණය (හෙක්ටයාර්)/(අක් රූ. පර්.) |
| | | | | | | | |

"ආ" ආකෘතිය

# 2006.06.30 දිනට රජයේ වත්කම් පිළිබඳ වාර්තාව

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :-

වර්ගය - ගොඩනැගිලි

| අනු අංකය | වර්ගනාම් අංකය | ගොඩනැගිල්ල පිළිබඳ විස්තර | භූමි ප්‍රමාණය | පිහිටීම | | භාවිතයට | භාවිතයට නොගන්නා |
|---|---|---|---|---|---|---|---|
| | | | වර්ග අඩි | දිස්ත්‍රික්කය/ප්‍රා.ලේ.කොට්ඨාශය | ග්‍රාම.නි කොට්ඨාශය | ගනී/නොගනී | වර්ග අඩි ප්‍රමාණය |
| | | | | | | | |

"ඇ" ආකෘතිය

# 2006.06.30 දිනට රජයේ වත්කම් පිළිබඳ වාර්තාව

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :-

වර්ගය - ව්‍යුහය/සවිකිරීම්

| අනු අංකය | ව්‍යුහය පිළිබඳ විස්තර | ධාරිතාවය ප්‍රමාණය | පිහිටීම | | භාවිතයට | භාවිතයට ගොගන්නා ධාරිතාවය/ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | දිස්ත්‍රික්කය/ප්‍රා.ලේ.කොට්ඨාශය | ග්‍රාම.නි.කොට්ඨාශය | ගනී/ නොගනී | |
| | | | | | | |

"ඇ" ආකෘතිය

# 2006.06.30 දිනට රජයේ වත්කම් පිළිබඳ විස්තර

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :-

වර්ගය - යන්ත්‍ර සහ පිරියත

| අනු අංකය | යන්ත්‍ර සහ පිරියත පිළිබඳ විස්තර | ප්‍රමාණය | අත්පත්කර ගත් /මිලදී ගත් දිනය | වර්තමාන තත්වය | භාවිතයට ගත්/ නොගත් | භාවිතයට නොගන්නා ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

"ඉ" ආකෘතිය

# 2006.06.30 දිනට රජයේ වත්කම් පිළිබඳ වාර්තාව

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :-

වර්ගය - උපකරණ

| අනු අංකය | උපකරණ පිළිබඳ විස්තර | ප්‍රමාණය | අත්පත්කර ගත් /මිලදී ගත් දිනය | වර්තමාන තත්වය | භාවිතයට ගැනී/ නොගැනී | භාවිතයට නොගන්නා ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

"ඊ" ආකෘතිය

# 2006.06.30 දිනට රජයේ වත්කම් පිළිබඳ වාර්තාව

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :-

වර්ගය - වාහන

| අනු අංකය | විස්තර | කාල විශ්ලේෂණය | | | | | ප්‍රයෝජනයට නොගන්නා | |
|---|---|---|---|---|---|---|---|---|
| | වාහන වර්ගය | අවුරුදු 3 ට අඩු | අවුරුදු 3 සිට 5 දක්වා | අවුරුදු 5 සිට 8 දක්වා | අවුරුදු 8 ට වැඩි | වාහනවල එකතුව | වාහන සංඛ්‍යාව | වෙනත් |
| | කාර් | | | | | | | |
| | වෑන් | | | | | | | |
| | ජීප් | | | | | | | |
| | ඩබල් කැබ් | | | | | | | |
| | බස් | | | | | | | |
| | ලොරි | | | | | | | |
| | අනෙකුත් (කරු.සඳහන් කරන්න) | | | | | | | |

" උ" ඇමුණුම

# 2006.06.30 දිනට රජයේ වත්කම් පිළිබඳ විස්තර

අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව :-

දෙපාර්තමේන්තු අරමුදල/භාරයේ නම :-

වර්ගය :- ආයෝජන

| අනු අංකය | විස්තර | | වටිනාකම (රු. මිලියන) | ආයෝජනය කල දිනය | ආයෝජනය කල් පිරෙන දිනය | අපේක්ෂිත වාර්ෂික ඉපයීම් |
|---|---|---|---|---|---|---|
| | ආයෝජනවල ස්වභාවය (ස්ථාවර තැන්පතු/ඉල්ලුම් තැන්පතු/භාණ්ඩාගාර බිල්පත්/ප්‍රතිසුම්පත්/බැදුම්කර සොටස්/ණයකර) | ආයෝජනය කර ඇති ආයතනය (රජය/බැංකු/සමාගම්/ආදිය) | | | | |
| | | | | | | |